# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## කාර්මික ආරාවුල් (සංශෝධන)

**(131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා විසින් 2022 අගෝස්තු මස 10 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ජූනි මස 22 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[130 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනතේ 31ඈඇ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ මහාධිකරණයක නියෝගයකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන්, අදාළ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා වෙත සේවායෝජකයා විසින් ඇප මුදලක් තැබීමට විධිවිධාන සැලැස්වීම වේ.

*3 වන වගන්තිය* : මේ වගන්තිය මඟින්, බේරුම්කරුවකුගේ හෝ කාර්මික අධිකරණයක ප්‍රදානයකට එරෙහිව රිට් ආඥාවක් නිකුත් කරනු ලැබීම සඳහා අභියාචනාධිකරණයට කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් සේවායෝජකයා විසින් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඇප මුදලක් තැබීමට විධිවිධාන සැලැස්වීම පිණිස, ප්‍රධාන ප්‍රඥප්තියට 31ඈඇඈඇඈ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

*4 වන වගන්තිය* : මේ වගන්තිය මඟින්, මහෙස්ත්‍රාත් අධිකරණයක හෝ කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ නියෝගයකට එරෙහිව මහාධිකරණයට කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන්, සේවායෝජකයකු විසින් අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයට ඇප මුදලක් තැබීමට විධිවිධාන සැලැස්වීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියට 33අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

# කාර්මික ආරාවුල් (සංශෝධන)

එල්.ඩී.—ඕ. 25/2021

## (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2022 අංක    දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනතේ 31ඈඈ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

131 වන අධිකාරයේ 31ඈඈ වගන්තිය සංශෝධනය කිරීම

"(1අ) කම්කරු විනිශ්චය අධිකාරයක යම් ආඥාවකට එරෙහිව යම් කම්කරුවකු විසින් කරන ලද අභියාචනයක් මත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් මඟින් එම කම්කරුවාට පක්ෂව දෙන ලද අවසාන තීන්දුවකින් අතෘප්තියට පත් සේවායෝජකයකු ඒ තීන්දුවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන අවස්ථාවක දී, එම අභියාචනයට විෂයය වන නියෝගය මඟින්-

(අ) කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස පමණක් විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන මුදලක් ඇප මුදලක්; සහ

(ආ) කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස ද, එම කම්කරුවා නැවත සේවයේ පිහිටුවන ලෙස ද විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන මුදලක් සහ එම කම්කරුවාගේ සේවය අවසන් කරන ලද

අවස්ථාව වන විට එම කම්කරුවාගේ මාසික වැටුප හෝ වේතන මෙන් දොළොස් ගුණයක් වූ මුදලක ඇප මුදලක්,

සේවායෝජකයා විසින් ඒ විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(1ආ) (1අ) උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචනයක් ම, (1අ) උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල එම සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇති බවට කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(1ඇ) සෑම විනිශ්චය අධිකාරයක සභාපතිවරයකු විසින් ම, (1අ) උපවගන්තිය යටතේ ඇප මුදල් ලෙස ඉදිරිපත් කරනු ලබන සියලු මුදල් ශ්‍රී ලංකාවේ යම් අනුමත බැංකුවක පොළී දරන ගිණුමක තැන්පත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 31ඇඇඇඇඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇඇඇඇ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇඇඇඇඇ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

“සේවායෝජකයා විසින් අභියාචනාධිකරණයට ඉදිරිපත් කරන ඉල්ලීමක් සම්බන්ධයෙන් ඇප මුදලක් ඉදිරිපත් කළ යුතු බව

31ඇඇඇඇඇ. (1) මේ පනතේ 17(1) වගන්තිය යටතේ බේරුම්කරුවකු විසින් හෝ 24 වන වගන්තිය යටතේ කාර්මික අධිකරණයක් විසින් කරන ලද ප්‍රදානයකට එරෙහිව රිට් ආඥාවක ස්වභාවයේ වූ ආඥාවක් නිකුත් කරනු ලැබීම සඳහා සේවායෝජකයකු විසින් අභියාචනාධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවක දී, ඒ ඉල්ලීමට විෂයය වන්නා වූ ප්‍රදානය මඟින් කම්කරුවාට යම් මුදලක් ගෙවීමට නියම කරනු ලබන අවස්ථාවක දී, සේවායෝජකයා විසින් ඒ මුදලට සමාන මුදලක ඇප මුදලක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු අභියාචනාධිකරණය විසින් ඒ ඉල්ලීම සලකා බලනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල් ශ්‍රී ලංකාවේ අනුමත යම් බැංකුවක කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොළී දරන ගිණුමක තැන්පත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) මේ උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල ඒ සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 33අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 33අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

“මහාධිකරණයට කරන ඉල්ලීමක් සම්බන්ධයෙන් සේවායෝජකයා විසින් ඇප මුදලක් ඉදිරිපත් කළ යුතු බව

33අ. (1) යම් කම්කරුවකුට පක්ෂව කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කරන ලද ආඥාවක් හෝ කාර්මික අධිකරණයක හෝ බේරුම්කරුවකුගේ ප්‍රදානයක් අනුව කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් යම් සේවායෝජකයකුට එරෙහිව 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 136ආ වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද යම් ලිඛිත පැමිණිල්ලකට අනුව මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් දෙන ලද තීන්දුවක් මඟින් අතෘප්තියට පත් සේවායෝජකයකු, ඒ තීන්දුව සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයේ ප්‍රතිශෝධන අධිකරණ බලය ලබා ගැනීමට ඉල්ලීමක් කරන අවස්ථාවක දී, එම ඉල්ලීමට විෂයය වන්නාවූ ආඥාව මඟින් ඒ කම්කරුවාට යම් මුදලක් ගෙවීමට නියම කරනු ලබන අවස්ථාවේ දී සේවායෝජකයා විසින්, එම මුදලට සමාන මුදල් ප්‍රමාණයකින් වූ ඇප මුදලක් අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ ඇප මුදල් ලෙස ඉදිරිපත් කරන ලද සියලු මුදල්, ශ්‍රී ලංකාවේ අනුමත බැංකුවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොලී දරන යම් ගිණුමක තැන්පත් කරනු ලැබීම පිණිස කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල ඒ සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇති බවට අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසාන තීන්දුවට අනුකූලව, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද මුදල, ඒ මුදල මත වූ පොලිය ද සමඟ අදාළ පාර්ශ්වය වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**5.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.